# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1721/3 - 2011 අගෝස්තු 29 වැනි සඳුදා - 2011.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/79.

**1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 අංක 3 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (අදාළත්වය දීර්ඝ කිරීමේ) නියෝග යනුවෙන් සඳහන් කරනු ලැබේ.

2. (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත් කරන ලද හදිසි අවස්ථාව ඉකුත්වීම සහ (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 5 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක වලංගුභාවය සහ බලාත්මකභාවය 2011 අගෝස්තු මස 30 වැනි දින සිට අවසන්වීම යන කරුණු නොසළකා, රට තුළ සාමය අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා රජය විසින් සද්භාවයෙන් ගනු ලබන ප්‍රයත්නයන් වැඩිදියුණු කිරීම පිණිස, මෙම නියෝගවල උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති නියෝගවල විධිවිධානවල අදාළත්වය, එම උපලේඛනයේ II වැනි තීරයේ එයට අනුරූපිව නිශ්චිතව දක්වා ඇති දින දක්වා, අඛණ්ඩව පවතින ලෙස සළකනු ලැබිය යුතු ය.

උපලේඛනය

| *I වැනි තීරය*<br>*නියෝගයේ නම* | *II වැනි තීරය*<br>*නියෝග දීර්ඝ කරනු ලබන්නේ කවර දිනයක් දක්වාද යන්න* |
|---|---|
| 1. පුනරුත්ථාපන කොමසාරිස් - ජනරාල්වරයා පත් කිරීම, 2011 අගෝස්තු මස 25 වැනි දින අංක 1720/41 දරන, *අති විශෙෂ ගැසට් පත්‍රය.* | 2011 දෙසැම්බර් මස 31 වැනි දින |
| 2. 2011 අංක 6 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලනය කිරීමේ) නියෝගය. 2011 අගෝස්තු මස 8 වැනි දින අංක 1718/6 දරන, *අති විශෙෂ ගැසට් පත්‍රය.* | 2011 ඔක්තෝබර් මස 10 වැනි දින |
| 3. 2011 අංක 5 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලනය කිරීමේ) නියෝගය. 2011 අගෝස්තු මස 8 වැනි දින අංක 1718/7 දරන, *අති විශෙෂ ගැසට් පත්‍රය* | 2011 ඔක්තෝබර් මස 10 වැනි දින |

1A - G 14603— 830 (2011/08)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.